තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පල්ලිය වත්ත බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකර 2019 වර්ෂයේ සභාව වෙත භාර දී තිබුණද, එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය වූ සත්‍ය වියදම ප්‍රාග්ධනිත නොකර, රු.මිලියන 300 ක දළ තක්සේරු වටිනාකම ඉඩම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.	සත්‍ය වියදම ලබා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීම් කර තිබුණත් එම තොරතුරු ලැබී නොමැති බව.	ඉදි කරනු ලබන ගොඩනැගිලි වල නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුය.
(ආ)	සභාව සතුව තිබී පසුව වෙනත් රාජ්‍ය ආයතනයන් වෙත පවරා දී තිබුණු එකතු වටිනාකම රු.මිලියන 1.11 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණු අතර රු.450,000 කට තක්සේරු කර තිබුණු පැරණි බස් නැවතුම්පොළ ඉදිරිපිට කඩ කාමර ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ඉවත් කළ හා ගිණුම්ගත නොකළ ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	වර්ෂය තුළදී දරන ලද රු.790,592 ක ප්‍රාග්ධන වියදම්, ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ජංගම නොවන වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුය.
(ඈ)	සභාව විසින් පරිහරණය කරනු ලබන කැබ් රථය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සභාව සතු වාහන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.

(ඉ)	සභාවේ අංශ 17 ක අයිතම 225 කට අදාල ලී බඩු උපකරන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කළ බවත්,නිර්දේශ ලද පසු ලේඛනගත කරන බව.	ලී බඩු උපකරණ තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	2020 වර්ෂයේ දී කායවර්ධන මධස්ථාන දෙකක් ස්ථාපිත කිරීම සඳහා සභාවට ලබා දී තිබූ රු.මිලියන 1.85 ක් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර බැඳීම් ඇතිකර නොගත් ශේෂ සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	දෙසැම්බර් 31 දිනට බැඳීම් ඇතිකර ගත් හෝ ගෙවීමට ඇති බවට සනාථ වන වටිනාකම් සඳහා පමණක් ණයහිමියන් ඇතිකිරීම කළ යුතුය.
(උ)	වර්ෂයට අදාලව එකතුව රු.206,327 ක වියදම් අයිතම 08 ක් වෙනුවෙන් ණයහිමියන් ඇති කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ණයහිමි ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	සභාවේ ඉතිරිකිරීම් ගිණුම් දෙකක වර්ෂයට අදාල පොලිය රු.මිලියන 2.07 ක් වුවද, රු.මිලියන 2.38 ක් ලෙස රු.305,752 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පොලිය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
උපලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාතන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.778,475 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවත්, ඇතැම් ශේෂ සඳහා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බව සහ කාල විශ්ලේෂණය ඉදිරිපත් කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (2) වගන්තිය	සභාවට අයත් වරිපනම් සීමාව පුළුල් කිරීම සඳහා 2013 හා 2018 යන වර්ෂයන් වලදී ග්‍රාම නිලධාරී වසම් 10 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබුණද, එය ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බැවින් සභාවේ ආදායම් පුළුල් කර ගැනීමේ අවස්ථා අහිමි වී තිබුණි.	වසම් දියුණු කළ ප්‍රදේශ බවට පත් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත දන්වා යවා ඇති බව.	දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර තිබූ වසම් 10 හි වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වන වගන්තිය	වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කිරීම කළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර 2007 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය අවුරුදු 13 ක් විය.	2012 වර්ෂයේ සිට නව තක්සේරුවක් කර දෙනමෙන් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණත් මේ වන තෙක් තක්සේරුව ලබාදී නොමැති බව.	වරිපනම් දේපල යොමුගත පනතේ වගන්ති ප්‍රකාරව කාලානුරූපීව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3)	තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් 2020 දෙසැම්බර් 31 දින කාර්ය වර්ධන මධ්‍යස්ථාන 02 ක් ස්ථාපිත කිරීම සඳහා ලබාදී තිබූ රු.මිලියන 1.85 ක මුදල අදාළ කාර්යය සඳහා යොදවා ගැනීමට කටයුතු නොකර හා 2019 වර්ෂයේ සභාව විසින් අයකර තිබූ ජාතිය ගොඩනැගීමේ බද්ධ රු.42,320 ක් ප්‍රේෂණය කිරීමට කටයුතු නොකර පිළිවෙලින් වසර 04කට හා වසර 05 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	කාය වර්ධන මධ්‍යස්ථාන සඳහා ඇස්තමේන්තු සකස් කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරන බව.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල කාර්යය සඳහා තැන්පත් කළ මුදල් යොදාගැනීමට කටයුතු කළ යුතුය.

(ඈ)	2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරණ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය			
	i. 04 ඡේදය	කඩ කාමර බදුදුන් දිනයේ හෝ මාස 06 ක් ඇතුළත උපරිම වාර 06 කට යටත්ව එක්වන් මුදල් අයකළ යුතු වුවත්, තිස්සමහාරාම බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර 18 ක් වෙනුවෙන් රු.මිලියන 15.89 ක එක්වන් මුදල් නියමිත කාලය තුළ අයකරගෙන නොතිබුණි.	කඩ කාමර විවෘත කිරීමට පෙර එක්වන් මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව.	චක්‍රලේඛයේ යොමුගත ඡේදයේ විධිවිධාන අනුව කඩ කාමර වෙනුවෙන් අයකරනු ලබන එක්වන් මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය.
	ii. 05 ඡේදය	සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, සභාව සතු කඩ කාමර 17 ක්, අර්ධකාලීන වෙළඳසැල් 02 ක් සහ ලොතරැයි අලෙවි කුටි 03 ක අදාළ ගිවිසුම යාවත්කාලීන කර නොතිබුණි.	ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව සහ යාවත්කාලීන කිරීමට නොහැකි ගිවිසුම් අවලංගු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛයේ යොමුගත ඡේදයේ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර වල ගිවිසුම් යාවත්කාලීන කළ යුතුය.
(ඉ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන ධාවනයෙන් ඉවත්කර ඇති වාහන 10 ක් අපහරණය කිරීමට විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	අපහරණ කමිටු වාර්තා ලද පසුව නිර්දේශ ක්‍රියාත්මක කරන බව.	ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

1.7.2 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ ආයුර්වේද මධ්‍යස්ථානයේ සේවයේ නියුතුව සිටින ආයුර්වේද වෛද්‍යවරියකගේ 2022 ජනවාරි මස සිට මාසික වැටුප රු.100,000 ඉක්මවා තිබුණද, Advanced Personal Income Tax (APIT) අයකර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.	උපයන විට ගෙවීම් බදු අය කර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරන බව.	පවත්නා නීතිරීතිවලට අනුකූලව බදු අයකර ප්‍රේෂණය කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 33.58ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 22.11 විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන් තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	3,335,849	3,247,301	2,465,958	4,059,169	3,072,086	3,397,609	4,135,145	3,906,792
කුලී	17,406,401	14,485,522	12,910,403	68,444	16,694,830	13,701,423	18,337,271	3,931,896
බලපත්‍ර ගාස්තු	7,868,600	9,499,390	947,5297	132,830	5,597,192	9,764,727	10,135,007	545,870
වෙනත් ආදායම්	19,986,738	30,182,345	30,015,334	682,025	15,633,000	24,751,809	24,298,145	18,889,968
එකතුව	**48,597,588**	**57,414,558**	**54,866,992**	**4,942,468**	**40,997,108**	**51,615,568**	**56,905,568**	**27,274,526**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.මිලියන 27.27 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.මිලියන 57.41 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.මිලියන 84.69 ක් වුවද, රැස්කරන ලද ආදායම රු.මිලියන 54.87 ක් වීමෙන් ආදායම රැස්කිරීමේ ප්‍රගතිය සියයට 65 කට සීමා වී පැවතුණි.	විගණන නිරීක්ෂණය පිළිගන්නා බව.	හිඟ ආදායම් රැස්කර ගැනීමේ ප්‍රගතිය වර්ධනය කරගත යුතුය.

2.2.3 වරිපනම් හා බදු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වරිපනම් ඒකක 2236 කින් ලැබිය යුතු වරිපනම් ආදායම රු. මිලියන 3.48 ක් වූ අතර එම හිඟ හිටි ශේෂය තුල වර්ෂ 1 ත් 3 ත් අතර සහ වර්ෂ 03 ට වැඩි ශේෂ පිළිවෙලින් රු.මිලියන 1.08 ක් හා රු.මිලියන 1.74 ක් විය. එම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි.	වර්ෂ 1 ත් 3 ත් අතර සහ වර්ෂ 03 ට වැඩි ශේෂයෙන් රු.609,448 ක් අයකර ගෙන ඇති අතර රතු නිවේදන යැවීමෙන් රු.432,689 ක් අයකර ගැනීමට කටයුතු කල බව.	පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ආ)	ව්‍යාපාර ඒකක 111 කින් අයවිය යුතු රු.286,800 ක ව්‍යාපාර බදු පැවති අතර එම හිඟ හිටි ශේෂය තුළ වර්ෂ 1 ත් 3 ත් අතර සහ වර්ෂ 03 ට වැඩි ශේෂ පිළිවෙලින් රු.79,200 ක් හා රු.121,200 ක් විය. එම ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පනතේ 152 වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි.	රු.54,000 ක් අය කරගෙන ඇති බවත් හිඟ ශේෂ අය කර ගැනීමට නඩු පවරා ඇති බව සහ සමහර ආයතන නොමැති වීමෙන් හිඟ ශේෂ අය කර ගැනීමට ගැටළු පවතින බව.	පනතේ 152 වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ඇ)	වර්ෂ 05 කට පෙර සිට ලැබියයුතු විනෝද බදු ආදායම් රු.295,940 ක් අයකර ගෙන නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරන බව	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

2.2.4 කුලී

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 95 කින් ලැබිය යුතු කඩ කුලී රු.මිලියන 4.58 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර හිඟ හිටි ශේෂය තුළ වසර 03 ට වැඩි ශේෂය රු.මිලියන 1.62 ක් විය.	රු.මිලියන 1.04 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව සහ රු.මිලියන1.62 ක මුදල කපා හැරීම සඳහා යොමු කර ඇති බව.	පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

(ආ)	කිරින්ද පූජා නගරය ආශ්‍රිත සභාවට අයත්, කුලී ආදායම් අයකරමින් පැවති කඩ කාමර 58 ක්, 2023 වර්ෂයේ එම භූමියෙහි අයිතිය කිරින්ද විහාරස්ථානයට අයත් බව දක්වමින් එම අවස්ථාවේ සිට බිල් කිරීම් නවතා තිබුණු අතර එම දිනය දක්වා සභාවට අයවිය යුතු රු.මිලියන 1.62 ක් අයකර ගෙන නොතිබුණි. එමෙන්ම මෙම ඉඩම සහිත දේපල වල අයිතිය වෙනස්වීම් පිළිබඳ පැහැදිලි කර ගැටළු නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.	ඉඩමේ අයිතිය සභාව සතු නොවීම නිසා හිඟ අයකර ගැනීමට නොහැකි බවත් කපා හැරීමට යොමු කර ඇති බව.	හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතු අතර ඉඩම් සහිත දේපල වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව සතු ලේඛනගත කර තිබූ තිස්ස පොදු වෙළඳපොළ කඩ අල්ලි ඒකක 03 ක් හා ලොතරැයි අලෙවි කුටි 03 ක් දීර්ඝ කාලයක සිට භෞතිකව නොපැවතියද එම ඒකක වලින් ලැබිය යුතු කුලී ලෙස පිළිවෙලින් රු.11,338 ක් හා රු.112,620 ක් කඩ කුලී ලේඛනයේ දක්වා තිබුණි.	පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව.	කඩ කාමර භෞතික පරීක්ෂාවක් සිදුකර නිවැරදිව ලේඛන පිළියෙල කළ යුතුය.
(ඈ)	2013 වර්ෂයේ සිට ලැබියයුතු ගල් ක්‍රෂර් බදු ආදායම් රු.443,996 ක් හා 2022 වර්ෂයේ සිට පැවති වැසිකිලි බදු දීමෙන් ලැබියයුතු රු.10,178 ක් අයකර ගෙන නොතිබුණි.	ගල් ක්‍රෂර් බදු හිඟ මුදල් අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් නොමැති බව සහ රු.10,178 ක මුදල කපා හැරීමට යොමු කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

2.2.5 බලපත්‍ර ගාස්තු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 හා 2023 වර්ෂ වල සිට පැවති ලැබිය යුතු රථ වාහන නැවතුම්පොල ගාස්තු රු.108,736 ක් සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගෙන නොතිබුණි.	රු.57,853 ක් කපා හැරීමට යොමු කළ බව සහ ඉතිරි හිඟ අයකර ගැනීමට නීතිමය කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.

2.2.6 වෙනත් ආදායම්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු වාහන කුලියට දීමෙන් වසර 03 ඉක්මවූ රු.311,400 ක්ද, ආයතන 14 කින් ලැබිය යුතු කසළ ඉවත් කිරීමේ ගාස්තු රු.220,400 ක් අයකර ගෙන නොතිබුණු අතර කසළ ඉවත් කිරීමේ ගාස්තු වලින් රු.138,400 ක් 2020 වර්ෂයේ සිට පැවති ශේෂ විය.	ගලි බවුසර් හිඟයෙන් රු.139,755 ක් සහ කසළ ඉවත් කිරීමේ ගාස්තු වලින් රු.82,000 ක් අයවී ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.

(ආ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.මිලියන 29.79 ක් වූ අතර හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතුව තිබුණු රු.මිලියන 5.08 ක මුද්දර ගාස්තු ආදායම් විවිධ ගැටළු සහගත තත්ත්ව මත පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් රඳවාගෙන තිබුණු අතර ඒ පිළිබඳ අවධානය යොමුකර එම ආදායම් නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මුද්දර ගාස්තු හිඟයෙන් රු.මිලියන 28.85 ක් අයවී ඇති බව සහ හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් උද්ධකන්දර කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කාර්යාල ගොඩනැගිල්ල 2023 නොවැම්බර් 24 දින ගිනිගැනීමකට ලක්වීමෙන් භාණ්ඩ වර්ග 22 කට අයත් භාණ්ඩ ඒකක 40 ක් විනාශ වී තිබුණි. මෙහි ප්‍රාරම්භක පරීක්ෂණයක් පැවැත්වීම සඳහා සභාවේ නිලධාරිනියන් දෙදෙනෙකු සහ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිලධාරිනියක් 2023 දෙසැම්බර් 04 දින පත්කර තිබුණද, පරීක්ෂණ කටයුතු වලට අදාළ වාර්තාව 2024 දෙසැම්බර් 31 දින වන විටත් සභාව වෙත ලබාදී නොතිබුණු අතර පත්කර තිබූ පරීක්ෂණ කමිටුවට හදිසි ගිනිගැනීම් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කිරීමට සුදුසු විශේෂඥ නිලධාරියෙකු පත්කර නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බවත් ඉදිරියේදී මෙවැනි අලාභ හානියකදී පරීක්ෂණ කඩිනමින් ආරම්භ කරන බව.	පරීක්ෂණ කටයුතු සුදුසු විශේෂඥ නිලධාරියෙකු යොදවා වාර්තාව කඩිනමින් ලබා ගෙන ඉදිරි කටයුතු කළ යුතුය.
(ආ)	බහුකාර්ය ගොඩනැගිල්ල අසළ ට්‍රාන්ස්පෝමරය ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථානයක් සොයා ගැනීමෙන් තොරව 2024 ජුනි 26 දින අනුමත සමිතියකට රු.201,690 ක් ගෙවීම් කර තිබුණි. එම ස්ථානයේ අර්ධ වශයෙන් ඉදි කිරීමෙන් පසු ගැටළු සහගත තත්ත්වයක් පැවති බව දක්වමින් වෙනත් ස්ථානයක ඉදිකිරීම් කටයුතු නැවත වරක් සිදුකර 2024 ජුනි 26 දින අංක 37 දරන වවුචරයෙන් එම සමිතියටම රු.429,399 ක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව අර්ධ වශයෙන් ඉදිකර අත්හැර දමා තිබූ කුටිය වෙනුවෙන් සභා අරමුදලින් ගෙවීම් කර තිබූ රු.201,690 ක මුදල නොසැලකිල්ල මත සභා අරමුදලට සිදුකර තිබූ පාඩුවක් විය.	ඉදිකර අතහැර දමන ලද කුටිය බුදු කුටියක් ලෙස නවීකරණය කරගත හැකි බැවින් මෙම මුදල සභා අරමුදලට පාඩුවක් නොවන බව .	ගොඩනැගිලි නිසි සැලැස්මකින් යුතුව ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතුය.
(ඇ)	2017,2021,2022 සහ 2023 වර්ෂවල සභාවේ වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා අවශ්‍ය ටයර් 10 ක් අලුතින් මිලදී ගැනීම සහ ටයර් 48 ක් නැවත පිරවීම වෙනුවෙන් එකතුව රු.මිලියන 1.44 ක් වැයකර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම ටයර් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. ඒ අනුව අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව ටයර් මිලදී ගෙන තිබීම සහ අරමුදල් අනවශ්‍ය වැය කිරීමක් විය.	ඉදිරියේදී අවශ්‍යතාවය හඳුනාගෙන ටයර් මිලදී ගැනීමට කටයුතු කරන බව.	අරමුදල් අරපිරිමැස්මෙන් යුතුව අවශ්‍යතාවය සලකා බලා මිලදී ගැනීම් සිදු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 185 රීතිය අනුව සභාවේ ඉතිරිකිරීම් ගිණුම් දෙකක සාමාන්‍ය මාසික මුදල් ශේෂය රු.මිලියන 54.38 ක් සහ රු.මිලියන 21.79 ක් වී තිබුණද, එම මුදල් ස්ථිර තැන්පතුවක ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ස්ථිර තැන්පතුවක ආයෝජනය කරීමට කටයුතු සිදු කරන බව.	සභාව සතු අතිරික්ත මුදල් ඵලදායිව ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව සභාවේ විවිධ ඒකක සතුව පැවති, භෞතිකව නොතිබුණු භාණ්ඩ වර්ග 28 කට අයත් භාණ්ඩ ඒකක 134 ක්, මහජන පුස්තකාල දෙකකට ලැබී තිබූ රු.196,904 ක් වටිනා පුස්තකාල පොත් 700 ක් සහ වටිනාකම සඳහන් නොවූ පුස්තකාල පොත් 46 ක් ඌනතාවයක් ලෙස වාර්තා කර තිබුණද, එකී ඌනතාවයන්ගේ වටිනාකම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2024 දෙසැම්බර් 31දින වන විටත් ක්‍රියාකර නොතිබුණි.	ඌනතා සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බව.	සමීක්ෂණයෙන් හඳුනාගත් ඌනතා සම්බන්ධව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාවේ සභිකයින් දෙදෙනෙකු විසින් ලබා නොගත් සභික දීමනා රු.112,500 ක් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ආපසු යැවීමට හෝ හිලව් කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	සභා ආදායමට ගැනීමට කටයුතු කරන බව.	දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ආපසු යැවීමට හෝ හිලව් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජන දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා රු.මිලියන 62.92 ක වියදමක් දරා පන්නෙගමුව පොදු වෙළඳපොළ තුළ නව වෙළඳ සංකීර්ණය කඩ කාමර 28 ක් හා විවෘත ගොඩනැගිල්ලක් ඉදිකර 2021 වර්ෂයේදී සභාව වෙත භාරදී තිබුණි. කඩකාමර ටෙන්ඩර් කර බදු කරුවන් තෝරාගෙන එක්වන් මුදල්ද අයකරගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වසර 03 කට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, එම කඩ කාමර තක්සේරු කර කඩහිමියන් සමඟ ගිවිසුම්ගතව, භාරදීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සභාවට ලැබිය හැකිව තිබූ විශාල කඩ කුලී ආදායමක් අහිමිවී තිබුණි. එසේම ගොඩනැගිල්ල පිහිටි භූමියේ කොන්ක්‍රීට් කැටගල් ඇල්ලීම සඳහා සභාව විසින්ද රු.මිලියන 1.13 ක වියදමක් දරා තිබුණු අතර කඩ කාමර සහ වෙළඳ පරිශ්‍රය නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීමත්, නඩත්තු නොකිරීමත් නිසා මේ සඳහා දරන ලද සමස්ථ වියදමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගෙන නොතිබුණි.	2025 වර්ෂයේදී සංවර්ධන කටයුතු අවසන් කරන බව.	පන්නෙගමුව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර ඉදි කිරීම වෙනුවෙන් දරන ලද වියදම් වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ආ)	i. නාගරික සංවර්ධන අධිකාරිය විසින් තිස්සමහාරාම බස්නැවතුම්පොළ අසළ කඩකාමර 48 කින් යුත් බිම් මහලද, ප්‍රාදේශීය සභා කාර්යාලය පවත්වාගෙන යාම සඳහා පළමු මහලද, රැස්වීම් ශාලාව සඳහා දෙවන මහලද සහිතව සැලසුම්කර ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ල 2019 දෙසැම්බර් 02 දින ප්‍රාදේශීය සභාව වෙත භාරදී තිබුණි. මෙහි කඩකාමර 48 පිහිටි බිම් මහලෙහි වැඩ සම්පූර්ණයෙන්ම නිමකර, අනෙක් මහල් දෙකෙහි ඉදිකිරීම් කටයුතු වලින් සැලකිය යුතු ප්‍රමාණයක් නිමකර තිබුණි. 2023 පෙබරවාරි මාසයේදී ටෙන්ඩර් කර කඩ කාමර 41 ක් සඳහා බදුකරුවන් තෝරාගෙන එක්වන් මුදල් වශයෙන් රු.මිලියන 96.15 ක් අයකරගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වසර 05 කට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, එම කඩ කාමර තක්සේරු කර කඩහිමියන් සමඟ ගිවිසුම්ගතව, භාරදීමට කටයුතු කර නොතිබීමෙන් සභාවට ලැබිය හැකිව තිබූ ආදායම් මගහැරී තිබුණි.	2025 වර්ෂයේදී කඩකාමර විවෘත කිරීමට කටයුතු කරන බව.	තිස්සමහාරාම බස්නැවතුම්පල කඩකාමර 48 සහිත බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා දරන ලද වියදම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත යුතුය.
	ii. නැවත ටෙන්ඩර් කර බදු දීමට යෝජිත කඩ කාමර 07 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ටෙන්ඩර් කර බදු දීමට ක්‍රියාකර නොතිබීමෙන් සභාවට ලබාගත හැකිව තිබූ රු.මිලියන 11.71 ක එක්වන් මුදල් අහිමි වී තිබුණි.	එක්වන් මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව.	තිස්සමහාරාම බස්නැවතුම්පල කඩකාමර 48 සහිත බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා දරන ලද වියදම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත යුතුය.
	iii. කඩ කාමර ටෙන්ඩර් කිරීමෙන් රු.මිලියන 96.15 ක් වූ එක්වන් මුදල් ලැබී තිබුණද, මෙම ගොඩනැගිල්ලේ අඩුපාඩු සකස් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබීමෙන්, දැඩි අපිළිවෙල හා ප්‍රමාණවත් ඉඩකඩක් නොමැතිව පවත්වාගෙන යන මහජන සේවා සපයන ප්‍රාදේශීය සභා කාර්යාලයද එම ස්ථානයට ගෙන යාමට නොහැකි වී තිබුණි.	කඩ කාමර විවෘත කර කඩිනමින් කාර්යාලය සහිත දෙවන මාලයෙහි සංවර්ධන කටයුතු සිදු කරන බව.	තිස්සමහාරාම බස්නැවතුම්පොල කඩකාමර 48 සහිත බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා දරන ලද වියදම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවට අයත් ටිපර් රථය 2018 වර්ෂයේදී අලුත්වැඩියා කටයුතු සඳහා යොමුකර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ටිපර් රථය අලුත්වැඩියා කිරීමකින් තොරව ගරාජයේ පැවති අතර මෙම ගරාජය මේ වන විට වසාදමා තිබුණි. ඒ අනුව විධිමත් සොයා බැලීමක් නොමැති වීමෙන් වසර 06 කට වඩා වැඩි කාලයක් ටිපර් රථය ගරාජයේ පවතින බවත්, එය සභාවට පෙර තිබූ ආකාරයෙන් හෝ ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාල ඇස්තමේන්තු පරිදි අලුත්වැඩියාව සිදු කර ටිපර් රථය සභාව වෙත රැගෙන ඒමට කටයුතු කරන බව.	සභාව සතු ටිපර් රථයේ ආරක්ෂාව තහවුරු කර කඩිනමින් අලුත්වැඩියා කර සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ ඉදිකල මාර්ග දෙකක් සඳහා කොන්ක්‍රීට් කැටගල් කිලෝමීටර් 20 ක දුරකින් ප්‍රවාහනය කළ බව දක්වා කිලෝමීටරයකට රු.274.41 ක් බැගින් කොන්ත්‍රාත් සමිති වෙත ගෙවීම් කර තිබුණද, කොන්ක්‍රීට් කැටගල් මිලදීගත් ස්ථානය තහවුරු කිරීම සඳහා බිල්පතක් හෝ වෙනත් පිළිගත හැකි ලේඛනයක් ඉදිරිපත් කර නොතිබියදී, ප්‍රවාහන ගාස්තු ලෙස රු.60,920 ක් ගෙවීම් කර තිබුණි.	බිල්පතක් හා ලේඛන පසුව ඉදිරිපත් කර ඇති බව.	ඉදි කිරීම් වලට අදාල බිල්පත්, ගෙවීම් කිරීමට පෙර ලබාගත යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ තනතුරු 12 කට අදාළ පුරප්පාඩු 24 ක් පැවති අතර එය විධිමත් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරන බව.	සභාවේ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා පිළිබඳව සමාලෝචනයක් සිදු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛණය අනුව සුභ සාධක සේවා පහසුකම් වැඩසටහන යටතේ ක්‍රීඩා පිටි/ සුසාන භූමි නිරවුල් කිරීම සහ අලුත්වැඩියා සඳහා රු.මිලියනයක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එම සංවර්ධන ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.	ඉදිරියේදී අයවැය ලේඛණය අනුව සංවර්ධන ව්‍යාපෘති ඉටුකරන බව.	අයවැයගත සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආදායම් විෂයයන් 04ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.මිලියන 54.82 ක් වූ අතර එය සියයට 17 සිට සියයට 60 ක් දක්වා වූ පරාසයක විය.	තාත්වික ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව.	විචලනයන් අවම කිරීමත්, සැලසුම්කරණය විධිමත් කර ගැනීමත්, ආදායම් රැස්කිරීම කාර්යක්ෂම කර ගැනීමත් සිදු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 37 කට අදාලව එකතුව රු.මිලියන 5.05 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතුරු වී තිබුණි.	ඉදිරියේදී අයවැය ලේඛණය හා ක්‍රියාකාරී සැලැස්ම පරිදි සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට කටයුතු කරන බව.	විචලනයන් අවම කරගත යුතු අතර ඒ සඳහා සැලසුම්කරණය විධිමත් විය යුතුය.

4.3 තිරසර සංවර්ධන ඉලක්ක

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අප්‍රේල් 23 දිනැති අංක විලේ පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලගාවීම (ලගාකරගත් දර්ශක) පරීක්ෂාවේදී, අරමුණු 04 ක් යටතේ ඉලක්ක 06 ක ලගාවීම් දර්ශක 07ක ප්‍රගතිය සංඛ්‍යාත්මකව දක්වා නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දුන් බව.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රගතිය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.